පේදුරුතුඩුව නගර සභාව

යාපනය දිස්ත්‍රික්කය

-------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම

-----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 25 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 මාර්තු 30 දින ඉදිරිපත් කරන ලදි. වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 20 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

-------

මාගේ පරික්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව පේදුරුතුඩුව නගර සභාව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර 2012 දෙසැම්බර් 31 දිනට පේදුරුතුඩුව නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

-------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

(අ) වත්කම්, වගකීම් සහ ආදායම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි නිරික්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | වත්කම් | | වගකීම් | | ආදායම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| අඩුවෙන් දැක්වීම් | - | - | - | - | 01 | 10,017,755 |
| වැඩියෙන් දැක්වීම් | 01 | 22,853 | 02 | 709,184 | - | - |
| වර්ගීකරණ දෝෂ | 01 | 29,250 | - | - | - | - |

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

---------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.8,127,941 ක් වූ ගනුදෙනු 04 ක් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරිමට නොහැකි විය.

2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම් ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.1,030,071 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.2,579,336 ක් විය.

2.2 මූල්‍ය පාලනය

------------------

අයවැය ලේඛනයේ නිසි පරිදි පිළියෙල කර නොතිබූ අතර, එබැවින් තථ්‍ය ආදායම් සහ අයවැය ගත ආදායම් අතර රු.31,875,951 ක වෙනසක් ද අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර රු.8,456,810 ක වෙනසක් ද විගණනයේදි නිරික්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

--------------------------------------------------------------------------

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් වූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 966 | 1,068 | 3,373 |
| බදුකුලී | 46,728 | 16,377 | 107 |
| බලපත්‍ර ගාස්තු | 229 | 403 | - |
| වෙනත් ආදායම් | 31,662 | 29,862 | 1,694 |

2.3.2 ආදායම් අයකිරීම

--------------------

රු.4,246,822 ක් වූ හිඟ ආදායම් ණයගැතියන් අයකර ගැනීම පිණිස සභාව ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

2.3.3 ආදායම් අහිමි වීම

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විදුලිබලය සැපයීමට අදාළ කටයුතු ලංකා විදුලිබල මණ්ඩලයට භාරදී තිබුණු නමුත් සභා බල ප්‍රදේශයේ වීථි ලාම්පු නඩත්තුව සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය තුල වීථි ලාම්පු නඩත්තුව සඳහා සභාව විසින් දරන ලද රු.1,182,000 ක් වූ වියදමක් ප්‍රතිපූරණය කර නොතිබුණෙන් සභාවට ආදායම් අහිමිවීමක් සිදු තිබුණි.

(ආ) සාප්පු සංකීර්ණයේ ඉදිකිරීම් වැඩ ප්‍රමාද වීම නිසා සභාවට ආදායම් අහිමිවීමක් සිදු වී තිබුණි.

2.3.4 උසාවි දඩ

--------------

සමාලෝචිත වර්ෂය තුල විවිධ අණ පනත් යටතේ පනවන ලද රු.2,698,500 ක්වූ උසාවි දඩ ගිණුම් වලට ගෙන නොතිබුණි.

2.3.5 මුද්දර ගාස්තු

------------------

2010, 2011 සහ 2012 වර්ෂ සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු පිළිවෙලින් රු.3,731,540, රු.6,196,884 සහ රු.7,319,255 ක් වූ මුද්දර ගාස්තු ගිණුම් ගතකර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

---------------------------------

2.4.1 නිෂ්ක්‍රීය සහ ඌණ උපයෝජිත භෞතික සම්පත්

-----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i.) සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව, තොග විෂයයන් 47 ක් හානි වී තිබුණු බවත් විෂයයන් 18 ක් අළුත්වැඩියා කළයුතු බවත් විෂයයන් 113 ක් වෙන්දේසි කළයුතු බවත් නිරීක්ෂණය විය. කෙසේ වුවද මෙම විෂයයන් භාවිතයට නොගෙන ගබඩාවේ තබා තිබුණි.

(ii.) අළුත්වැඩියා කළයුතු තත්ත්වයේ තිබූ අංක 270-0050 දරන ට්‍රැක්ටරය අළුත්වැඩියා කිරීමට පියවර නොගෙන ගරාජයේ තබා තිබුණි.

(iii.) අල්හදීන් බට 23 ක් වෙන්දේසි කිරීමට සමීක්ෂණ මණ්ඩලය නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද මෙම විෂයය නැති වී තිබුණු බව භෞතික පරීක්ෂණයේදී අනාවරණය විය.

2.4.2 අයකරගත යුතු කාර්ය මණ්ඩල ණය

---------------------------------------------

සේවය අත්හැර ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු රු.8,000 ක් වූ කාර්ය මන්ඩල ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4.3 හරිවැරදි නොබැලූ වත්කම්

-----------------------------------

වත්කම් හරිවැරදි බැලීමකින් සනාථ නොකොට පොත් අගය පදනම්ව රු.20,173,019 ක් ලෙස මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා තිබුණි.

2.5 අනුකූල නොවීම්

---------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්හි විධිවිධානයන්ට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි කළමනාකරණ තීරණ ආදායට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i.) මුදල් රෙගුලාසි 571 | - | වර්ෂ 2 ට වඩා පැරණි රු.8,682,183 ක් වූ විවිධ තැන්පතු ආදායමට බැරකර නොතිබුණි. |
| (ii.) මුදල් රෙගුලාසි 234 | - | මාස 06 ක් ඉකුත් වූ රු.1,700 ක් වටිනා උපලබ්ධි නොවූ චෙක්පත් 02 ක් පිළිබඳව පසු විපරම් කටයුතු කර නොතිබුණි. |
| (ආ) උතුරු පළාත් සභාවේ මුදල් රීති අංක 101 සහ 102 | - | අභ්‍යන්තර විගණන වැඩසටහන සහ ත්‍රෛමාසික අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පණත | - | 2010, 2011 සහ 2012 වර්ෂයන්හිදි අයකළ රු.1,058,742 ක් වූ එකතු කළ අගය මත බදු |

දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පණත - 2010, 2011 සහ 2012 වර්ෂයන්හිදි අයකළ රු.175,921 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඉ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - ටෙන්ඩර් නොකැඳවා සහ ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ ලබා නොගෙන සමාලෝචිත වර්ෂය තුලදි සභාව රු.1,578,900 ක් වටිනා වාහනයක් මිලදි ගෙන තිබුණි.

(ඊ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/2007 - චක්‍රලේඛයේ විධිවිධානයන්ට පටහැනිව නිලධාරියෙකුට රු.403,200 ක් ලබා දි තිබුණි.

2.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ ප්‍රමාදය

-------------------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේදි ක්‍රියාත්මක කළයුතු වු ව්‍යාපෘති 03 ක් සඳහා වු රු.566,011 ක් වු වියදම් එම කාලපරිච්ඡේදය සඳහා නොගෙවා ඉදිරියේදි ප්‍රයෝජනයට ගැනිම පිණිස විවිධ ණයහිමි ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කළ යුතු ප්‍රාග්ධන වැඩ 05 ක් සඳහා වු රු.2,923,338 ක් වු මුදලක් ඉදිරියේදි ප්‍රයෝජනයට ගැනිම සඳහා විවිධ ණයහිමි ගිණුමෙහි රඳවාගෙන තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා වු සභාවෙහි අයවැය ලේඛනයෙහි මෙය ඇතුළත් වි නොතිබුණි.

(ඇ) රු.8,800,000 කට ඇස්තමේන්තු කළ ව්‍යාපෘති 08 ක් සමාලෝචිත වර්ෂය තුලදි ක්‍රියාත්මක කර නොතිබුණි.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.1,120,346 ක් වූ ප්‍රදාන අදාළ විශේෂිත කාර්යයන් සඳහා යොදවා නොගෙන තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

(ආ) 2011 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකරගත් රු.171,174 ක් වූ රැඳවුම් මුදල් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට කටයුතු නොකොට විවිධ තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

(ඇ) ප්‍රජා මධ්‍යස්ථානයන්ට අදාල රු.4,093 ක් එම මධ්‍යස්ථානයන්ට නොගෙවා වර්ෂ 02 කට අධික කාලයක් විවිධ තැන්පතු ගිණුමෙහි තබාගෙන තිබුණි.

2.8 අභ්‍යන්තර විගණනය

-------------------------------

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(i.) ආදායම් රැස්කිරීම

(ii.) ස්ථාවර වත්කම්

(iii.) පරිත්‍යාග

(iv.) විවිධ තැන්පතු

(v.) ගිණුම්කරණය

(vi.) අයවැය පාලනය